සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණ, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 13, Year End Test, July 2019**

## ආර්ථික විද්‍යාව I
## Economics - I

21 S I

පැය 02 යි
Two hours

විභාග අංකය:.....................................................................

උපදෙස්: * සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* ප්‍රශ්න අංක 01 සිට 50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු තෝරා ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.

1. පහත දෑ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශය හඳුනාගන්න.
   1. වසරකට ජීවිත 20000 ක් අහිමි කරමින් දුම්කොළ සමාගම දිනකට රුපියල් කෝටි 40 ක ආදායමක් ලබාගනී.
   2. රට තුළ බීජ බෝංචි අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට බෝංචි බීජ ආනයනය කළ යුතුය.
   3. වැරදිකරුවන් වන රියැදුරන්ට ගෙවීමට සිදුවන තැපැල් ගාස්තුව දඩ මුදලින් 10% ක ප්‍රමාණයකි.
   4. වසර 16 කට පසු ශ්‍රී ලංකාවේ අඩුම ආර්ථික වර්ධන වේගය වාර්තා කළේ 2017 වර්ෂයේ ය.
   5. අසීමිත වුවමනා සපුරාලීමේ සම්පත් ආර්ථිකය සතුව ඇත්තේ සීමිත ප්‍රමාණයකි. (..................)

2. නූතන ආර්ථිකයේ වර්ධනය වෙමින් පවත්නා රාජ්‍ය නොවන සංවිධාන සතු කාර්යභාරය කවරේ ද?
   1. ආර්ථික හා පෞද්ගලික අයිතිවාසිකම්කම් ආරක්ෂා කර දීම.
   2. නීති රීති ව්‍යවස්ථාවන් සැකසීම්
   3. දිළිඳුකම තුරන් කිරීමට දායකවීම
   4. සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර දීම
   5. සේවා නියුක්තියට, නිෂ්පාදන තාක්ෂණයට, වැටුප් මට්ටමට බලපෑම් කිරීම (..................)

3. පහත දැක්වෙන්නේ එක්තරා ආර්ථිකයක් සම්බන්ධ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකි.




ඉහත තොරතුරු අනුව A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය දක්වා ගමන් කිරීමේදී එම ආර්ථිකය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
   1. ආර්ථික අවපාත තත්ත්වයන් පෙන්වන අතර එහිදී සම්පත් විනාශ වීමක් දක්නට ඇත.
   2. ආර්ථිකයේ මූර්ත නිෂ්පාදනය අඛණ්ඩව දිගුකාලීනව පහළ යාමක් පෙන්නුම් කර ඇත.
   3. සම්පත් විනාශ වීමකින් තොරව ආර්ථික පසුබෑමක් පෙන්නුම් කර ඇත.
   4. වර්තමාන පරිභෝජනය හා අනාගත පරිභෝජනයට සම්පත් යොදා වෙන්කිරීම පෙන්නුම් කර ඇත.
   5. සම්පත් සම්භාරය අඩුවී නිෂ්පාදන හැකියාව අඩුවන ආකාරය පෙන්නුම් කර ඇත. (..................)

4. කාරක ප්‍රාග්ධනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. භාවිතයට ගැනෙන කාලය මුළුල්ලේ ම කිසියම් ප්‍රතිලාභ ප්‍රමාණයක් හිමිකරුට ලබාදෙයි
   2. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අඛණ්ඩව යෙදවිය හැකි වෙයි.
   3. රටක ඉදිරි නිෂ්පාදන සැලසුම් සකස් කිරීමේදී වැදගත් වෙයි.
   4. ශ්‍රමිකයාගේ ඵලදායිතාව වැඩි කරගැනීමට දායක වෙයි.
   5. ආර්ථික භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලිය පහසු කරවයි. (..................)

5. පාන් සඳහා ඉල්ලුම් වක්‍රය පිළිබිඹු කරන සමීකරණය Qd=100-2p වෙයි. එම සමීකරණයේ සිට Qd=80 - 2p ලෙස වෙනස් වීමට බලපෑ හේතු වනුයේ,
1. පාන් පාරිභෝගිකයන්ගේ අභිරුචිය ඉහල යාමකි. 2. පාන් පාරිභෝගිකයින් මත බද්දක් පැනවීමයි.
3. පාන් නිෂ්පාදකයින්ට සහනාධාරයක් ලබා දීමයි 4. බටර් මිල පහළ යාමයි
5. පාන් මිල පහළ යාමයි (..................)

6. එක්තරා භාණ්ඩයක එක් පාරිභෝගිකයෙකුගේ ඉල්ලුම් මිල ශ්‍රිතය පහතින් දැක්වේ.
$P = 10 - 5Qd$ මෙම ශ්‍රිතයට සමාන පාරිභෝගිකයන් දස දෙනකු වෙළෙඳ පොළෙහි සිටි නම් වෙළෙඳ පොළෙහි ඉල්ලුම් ශ්‍රිතය වනුයේ,
1. $P = 100 - 50\,Qd$ 2. $Qd = 100 - 5p$ 3. $Qd = 20 - 2P$ 4. $10 - 2Qd$ 5. $Qd = 20 - P$

(..................)

7. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් වක්‍රයට අදාල ඉල්ලුම් ශ්‍රිතය පහත පරිදි වෙයි.
Qd=200-5p
ඉහත භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාව එකට සමාන වනුයේ කවර මිලේදී ද?
1. රු 10 දී ය. 2. රු 15 දී ය 3. රු 20 දී ය 4. රු 25 දී ය 5. රු 30 දී ය

(..................)

8. එක්තරා භාණ්ඩයක මිල 4% කින් ඉහළ ගිය අතර අලෙවි ප්‍රමාණය 2% කින් ඉහළ ගියේ නම් නිෂ්පාදකයාගේ අයභාරය ආසන්න වශයෙන් ඉහළ යනුයේ,
1. 10% කිනි 2. 8% කිනි 3. 7% කිනි 4. 6%කිනි 5. 4% කිනි

(..................)

9. පහතින් දැක්වෙන්නේ සමාන පරිමාණයන් ගෙන් යුක්තව A B C D භාණ්ඩ හතර සඳහා අදාළ ඉල්ලුම් වක්‍රයන් ය.

A B C D




(..................)

අලෙවිකරුවන් වැඩි කරගැනීමේ අපේක්ෂාවෙන් සැපයුම්කරුවන් කටයුතු කරයි නම් පහත ක්‍රියා මාර්ග අතරින් නොගැලපෙන ක්‍රියාමාර්ගය දැක්වෙන ප්‍රකාශය ඇතුළත් පිළිතුර කුමක් ද?
1. C භාණ්ඩයේ මිල වෙනස් නොකිරීම හා A භාණ්ඩයේ මිල අඩු කිරීම
2. A භාණ්ඩයේ මිල 10% කින් අඩු කිරීම හා B භාණ්ඩයේ මිල 5% කින් ඉහළ දැමීම
3. C භාණ්ඩයේ මිල වෙනස් නොකිරීම හා B භාණ්ඩයේ මිල 10% කින් වැඩි කිරීම
4. D භාණ්ඩයේ මිල 10% කින් වැඩි කිරීම හා A භාණ්ඩයේ මිල 10% කින් අඩු කිරීම
5. A B C D යන භාණ්ඩ වර්ග හතරෙහි ම මිල 10% කින් ඉහළ දැමීම (..................)

10. එක්තරා භාණ්ඩයක සැපයුම් වක්‍රයට අදාල සැපයුම් සමීකරණය පහත පරිදි වෙයි.
$Q = 6 + 2p$
1. ඕනෑ ම ලක්ෂයක නම්‍යතාව 1ට අඩු වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය වැඩි වෙයි.
2. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව 1 ට අඩු වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය අඩුවෙයි.
3. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව 1 ට වැඩි වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය වැඩි වෙයි.
4. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව 1 ට අඩු වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය ස්ථාවර වෙයි.
5. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව ස්ථාවර වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකය අඩු වෙයි.

11. පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකඟ විය නොහැකි ප්‍රකාශය වනුයේ,
   1. භාණ්ඩයක ඉල්ලුම පූර්ණ අනම්‍ය නම් පාරිභෝගික අතිරික්තය තීරණය කළ නො නොහැකියි.
   2. භාණ්ඩයක ඉල්ලුම පූර්ණ නම්‍ය වේ නම් පාරිභෝගිකයා ගෙවීමට කැමති මිලත් ගෙවන මිලත් සමාන වෙයි.
   3. භාණ්ඩයක ඉල්ලුම පූර්ණ නම්‍ය වේ නම් පාරිභෝගික අතිරික්තය ශූන්‍ය වෙයි.
   4. භාණ්ඩයක සැපයුම පූර්ණ අනම්‍ය නම් පාරිභෝගික අතිරික්තය ශූන්‍ය වෙයි.
   5. භාණ්ඩයක ඉල්ලුමට සාපේක්ෂව සැපයුම් අනම්‍ය වේ නම් පාරිභෝගික අතිරික්තය ධන අගයක් ගනියි.

(..................)

12. වෙළඳපොළ තීරණය වී ඇති සමතුලිත මිල සැපයුම්කරුවන්ට ප්‍රමාණවත් නොවේ යන තීරණය මත රජය විසින් මිල ආධාරක ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ අතිරික්ත සැපයුම කළමනාකරණය කිරීමේ ප්‍රතිඵල දක්වෙන රූප සටහන් පහත පරිදි වෙයි. මෙම ප්‍රතිපත්තිය මගින් පාරිභෝගික අතිරික්තයට, නිෂ්පාදක අතිරික්තයට හා සමාජ ශුභ සාධනයට සිදුවන බලපෑම පිළිවෙලින් දක්වෙන්නේ,




   1. වැඩිවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
   2. අඩුවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
   3. වැඩිවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
   4. වෙනස් නොවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
   5. අඩු වෙයි, වැඩිවෙයි, වැඩිවෙයි

(..................)

13. එක්තරා කන්නයකදී අස්වැන්න පහළ ගිය ද ගොවීන්ගේ අළෙවි ආදායම් ඉහළ යාමක් සිදුවිය. මේ සඳහා පහත සඳහන් කවර තත්ත්වයක් බලපානු ලැබේ ද? වඩාත් නිවැරැදි පිළිතුර වනුයේ කුමක්ද?
   1. වී සඳහා නම්‍ය ඉල්ලුමක් හා නම්‍ය සැපයුමක් පැවතීමයි.
   2. වී සඳහා අනම්‍ය ඉල්ලුමක් හා අනමන්‍ය සැපයුමක් පැවතීමයි.
   3. වී සඳහා පූර්ණ නම්‍ය ඉල්ලුමක් හා පූර්ණ අනම්‍ය සැපයුමක් පැවතීමයි.
   4. වී සඳහා නම්‍ය ඉල්ලුමක් හා ඒකීය නම්‍ය සැපයුම පැවතීමයි.
   5. වී සඳහා ඒකීය නම්‍ය ඉල්ලුමක් හා පූර්ණ අනම්‍ය සැපයුම පැවතීමයි. (..................)

14. ගැනුම්කරුවන් මත පැටවෙන බද්ද සම්බන්ධ පහත ප්‍රකාශවලින් එකඟවිය නොහැකි ප්‍රකාශය කුමක්ද?
   1. ගැණුම්කරුවන්ගේ ඉල්ලුම් මිල බද්දෙහි ප්‍රමාණයෙන් අඩු වෙයි.
   2. ගැණුම්කරුවන් මත බද්ද සැපයුම් වක්‍රයට කිසි බලපෑමක් නොකරයි.
   3. බද්ද රජයට ගෙවීමට නෛතික වශයෙන් ගැණුම්කරු බැඳී සිටියි.
   4. බද්දට පෙර ගැණුම්කරු ගෙවූ මිල සහ විකුණුම්කරු ලැබූ මිල සමාන වන අතර බද්දට පසු ද එය සමාන වෙයි.
   5. බද්දට පසු ආර්ථික බදු ආපාතය බෙදීයාම ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව මත වෙනස් වෙයි. (..................)

15. කෙටි කාලයේ දී ආන්තික ඵලදාව උපරිම වීමෙන් පසු නිමැවුම ප්‍රසාරණය කරන විට දැකිය හැකි ලක්ෂණ හඳුනාගන්න.

| | ආන්තික ඵලදාව | සාමාන්‍ය ඵලදාව | මුළු ඵලදාව | ආන්තික පිරිවැය |
|---|---|---|---|---|
| 1. | අඩු වේ | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| 2. | අඩු වේ | අඩු වේ | අඩු වේ | වැඩි වේ |
| 3. | වැඩි වේ | අඩු වේ | අඩු වේ | අඩු වේ |
| 4. | වැඩි වේ | වැඩි වේ | අඩු වේ | අඩු වේ |
| 5. | ස්ථාවරය | අඩු වේ | වැඩි වේ | වැඩි වේ. |

(..................)

16. නිෂ්පාදන ආයතනයක ආන්තික පිරිවැය ඉක්මවූ ආන්තික අයභාරය පවතින විට නිමැවුම තවදුරටත් ප්‍රසාරණය කළේ නම්,
   1. අලාභය ඉහළ යනු ඇත.
   2. ආර්ථික ලාභ ඉහල යනු ඇත.
   3. ආන්තික පිරිවැය අඩු වනු ඇත.
   4. නිෂ්පාදකයා, නිෂ්පාදන කටයුතු වලින් ඉවත් වනු ඇත.
   5. ආර්ථික ලාභ ශූන්‍ය වනු ඇත.

(..................)

17. මුළු පිරිවැය සහ මුළු විචල්‍ය පිරිවැය අතර පවතින සිරස් දුර
   1. නිමැවුම අඩු වන විට අඩුවෙමින් පවතී
   2. නිමැවුම අඩු වන විට වැඩිවෙමින් පවතී
   3. ආන්තික පිරිවැයට සමාන වේ
   4. මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ
   5. සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වේ

(..................)

18. කෙටි කාලයේදී x භාණ්ඩය නිෂ්පාදනය කරන විට හටගන්නා ආන්තික පිරිවැය පහත සඳහන් ලේඛනයේ ඇතුළත් වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| x නිමැවුම් (ඒකක) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| ආන්තික පිරිවැය | 30 | 20 | 16 | 24 | 40 | 56 | 64 |

මුළු ස්ථාවර පිරිවැය රු 30/= නම් කෙටි කාලයේ දී සාමාන්‍ය මුළු පිරිවැය අවම වන්නේ කවර නිමැවුම් ඒකක ප්‍රමාණයයක දී ද?

1. නිමැවුම් ඒකක 2 දීය.
2. නිමැවුම් ඒකක 3 දීය.
3. නිමැවුම් ඒකක 4 දීය.
4. නිමැවුම් ඒකක 5 දීය.
5. නිමැවුම් ඒකක 6 දීය.

(..................)

19. පහත සඳහන් කටයුතු අතුරින් නිෂ්පාදන ඉම තුළට ඇතුලත් ආර්ථික කටයුත්ත කුමක්ද?
1. පවුලේ වැඩිහිටියන් සහ රෝගීන් රැක බලා ගැනීම
2. නිවැසියන් විසින් තම දරුවා පෞද්ගලික මෝටර් රථයෙන් පාසලට රැගෙන යාම
3. ආහාර පිස ගැනීම හා පිළිගැන්වීම
4. නිවසේ පදිංචි කරුවන් විසින් නිවස පිරිසිදු කර ගැනීම
5. මෙහෙකරුවන් විසින් කෑම පිළියෙල කරගැනීම

(..................)

20. බේකරි හිමියකුගේ පාන් නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | රුපියල් |
|---|---|
| පාන් තොගය වෙළඳපොලේ වටිනාකම | 10,000 |
| තිරිඟු පිටි වියදම | 1500 |
| බටර් මිලදී ගැනීම | 200 |
| පොල්තෙල් සඳහා වියදම | 150 |
| වෙනත් අමුද්‍රව්‍ය වියදම් | 50 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම | 100 |

ඉහත තොරතුරු හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. පාන් තොගයේ දළ වටිනාකම රුපියල් 2100 ක් වේ.
2. අතරමැදි පරිභෝජනය රුපියල් 2100 ක් වේ.
3. නිමවුමේ ශුද්ධ එකතු කළ අගය රුපියල් 12000 ක් වේ.
4. නිමවුමේ දළ එකතු කළ අගය රුපියල් 8000 ක් වේ.
5. නිමවුමේ දළ වටිනාකම රුපියල් 10100 ක් වේ.

(..................)

21. එක්තරා ආර්ථිකයක පසුගිය වර්ෂයට අදාළ කල්පිත දත්ත පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන වලින්)

| | |
|---|---|
| පෞද්ගලික ඉතුරුම් | 1400 |
| මුළු රාජ්‍ය ආදායම | 5400 |
| රාජ්‍ය වර්තන වියදම | 5600 |
| කුටුම්බ ඉතිරිකිරීම් | 800 |
| දළ දේශීය නිෂ්පාදිතය (වෙළෙඳ මිල) | 10,000 |

මෙම ආර්ථිකයේ දේශීය ඉතිරිකිරීම් අනුපාතය

1. 10%
2. 12%
3. 14%
4. 16%
5. 20%

(..................)

22. කිසියම් වර්ෂයක එක්තරා ආර්ථිකයට අදාළ කල්පිත දත්ත පහත දක්වේ. (වටිනාකම රුපියල් බිලියන)

| | |
|---|---|
| සේවක ආදායම් | 500 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 1200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 200 |
| මිශ්‍ර ආදායම් | 300 |
| තොග හෙවත් පරිලේඛන වෙනස්වීම් | 250 |
| නිෂ්පාදන මත වෙනත් බදු - එම සහනාධාර | 100 |
| භාණ්ඩ හා සේවා මත අයකරන බදු - එම සහනාධාර | 400 |

වෙළෙඳපොල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන

1. 2950 කි
2. 2850 කි
3. 2700 කි
4. 2600 කි.
5. 2300 කි.

(..................)

23. කල්පිත ආර්ථිකයක රාජ්‍ය මිලදී ගැනීම් රුපියල් මිලියන 500 කින් ඉහළ යන විට මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2000 කින් ඉහළ ගොස් ඇත. මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැමියාව.

1. 0.9 කි
2. 0.8 කි
3. 075 කි
4. 0.6 කි
5. 0.25 කි

(..................)

24. සරල ආර්ථික ක්‍රමයක පරිභෝජන ශ්‍රිතයේ ලක්ෂ්‍ය දෙකක් පහත දැක්වේ.

| yd(රු.ද.ල.) | C (රු.ද.ල) |
|---|---|
| 1000 | 750 |
| 2000 | 1350 |

මෙම ආර්ථිකයේ ඉතිරිකිරීම් ශ්‍රිතය

1. S=150+0.4yd
2. S=150+0.4yd
3. S=-150+0.6yd
4. S= -150+0.6yd
5. S=-1000+0.4yd

(..................)

25. ආර්ථිකයක සමාහාර ඉල්ලුම් විශාලතම වැඩිවීමක් හට ගනුයේ පහත සඳහන් කවරක් හේතු කොටගෙන ද?
1. රුපියල් මිලියන 500 කින් රාජ්‍ය වියදම් ඉහළ දැමීම.
2. රුපියල් මිලියන 500 කින් බදු කපා හැරීම.
3. රුපියල් මිලියන 500 කින් සංක්‍රාම වියදම් ඉහළ දැමීම.
4. රුපියල් මිලියන 500 කින් බදු ඉහළ දැමීම සමග රුපියල් මිලියන 200 කින් රාජ්‍ය වියදම් ඉහළ දැමීම.
5. රුපියල් මිලියන 500 කින් බදු පහළ හෙළීම සමග ආයෝජන වියදම් රුපියල් මිලියන 200 කින් ඉහළ දැමීම.

(..................)

26. ආසන්න මුදලක සුවිශේෂ ලක්ෂණය වන්නේ කුමක් ද?
1. හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම.
2. වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම.
3. පූර්ණ ද්‍රවශීලතාවයෙන් යුක්ත වීම.
4. මහජනතාව නමින් වාණිජ බැංකුවල පවතින ඉල්ලුම් තැන්පතු ශේෂ නියෝජනය කිරීම.
5. චෙක්පත් මගින් අන්සතු කළ හැකි වීම

(..................)

27. ද්‍රවශීලතාව යනු,
1. අවම පිරිවැයක් හා අවම කාලයක් තුළ වත්කම්, විනිමය මාධ්‍යයක් බවට පෙරළා ගැනීමේ හැකියාව.
2. මුදල් හා පොලී අනුපාතිකය අතර පවත්නා ප්‍රතිලෝම සම්බන්ධතාවයයි.
3. පොලී අනුපාතික වෙනසකින් තොරව මුදල් ඉල්ලුම වෙනස් වීමයි.
4. මුදල් මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට මහජනතාව දක්වන කැමැත්තයි.
5. ගනු දෙනු කිරීමේ චේතනාවෙන් සිය වත්කම් මුදල් බවට පෙරළා ගැනීමයි.

(..................)

28. මුදල් සැපයුම රුපියල් මිලියන 10 ක් සහ සංසරණ ප්‍රවේශය 2 වන ආර්ථික මුදල් සැපයුම දෙගුණ වුව හොත් වෙළඳ පොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය
1. 20% කින් ඉහළ යයි
2. 40% කින් ඉහළ යයි
3. 50% කින් ඉහළ යයි
4. 100% කින් ඉහළ යයි
5. 200% කින් ඉහළ යයි

(..................)

29. වාණිජ බැංකු ශේෂපත්‍රයක වත්කම් කිහිපයක් පහත දැක්වේ.

A - අතැති මුදල්
B - භාණ්ඩාගාර බැඳුම්කර
C - මහබැංකුවෙන් අයවිය යුතු ශේෂ
D - භාණ්ඩාගාර බිල්පත්
E - දේශීය බැංකුවලින් අයවිය යුතු ශේෂ
F - අතැති හා විදේශ බැංකුවලින් අයවිය යුතු විදේශ මුදල්

ඉහත වත්කම් අතුරෙන් ප්‍රාථමික සංචිත වශයෙන් සලකන දෑ අඩංගු පිළිතුරු කාණ්ඩය කුමක් ද?
1. A, B, C හා D
2. A, B, C, හා F
3. A, C, D හා E
4. A, C, D, හා F
5. A, C, E හා F

(..................)

30. පහත සඳහන් කවරක් පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනයට හේතු වේ ද?
1. මුදල් සැපයුමේ වැඩි වීමක්
2. කුටුම්භ පරිභෝජනයේ ඉහළ යාමක්
3. ශ්‍රමයේ මිල ඉහළ යාමක්
4. රජයේ මිලදී ගැනීම් පහළ බැසීමක්
5. විදුලි බලයේ මිල පහළ බැසීමක්

(..................)

31. තත්කාලීන දළ පියවුම් පද්ධතිය (RTGS) යනු,
1. මුදල් වෙළෙඳපොළ මූල්‍ය ආයතනයකි.
2. ප්‍රාග්ධන වෙළෙඳපොළ මූල්‍ය ආයතනයකි.
3. මුදල් වෙළෙඳ පොළේ හුවමාරුවන උපකරණයකි.
4. මූල්‍ය යටිතල පහසුකමකි.
5. මූල්‍ය නියාමන ආයතනයකි.

(..................)

32. ධාරිතා මට්ටම උපරිමය කරා ළඟාවන තුරු පාරිභෝජනයේ තරඟකාරීත්වයක් දැකිය නොහැකි එහෙත් පරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩයකට නිදසුනක් වන්නේ,
1. මුහුදු වෙරළක්
2. ජාතික ආරක්ෂාව
3. වායු ගෝලය
4. මෝටර් රථයක්
5. තෘණ භූමියක් (..................)

33. සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්තිවල උපකරණයක් ලෙස ඍජුවම සැළකිය නොහැක්කේ කුමක් ද?
1. බදු ප්‍රතිසංස්කරණයේ ය.
2. පෞද්ගලීකරණය
3. ප්‍රතිපත්ති පොලී අනුපාතිකය
4. නියාමනහරණය
5. ශ්‍රම වෙළෙඳ පොළ ප්‍රතිසංස්කරණය (..................)

34. පහත ඒවා අතුරින් සංක්‍රාම වියදමක් ලෙස සලකා ජාතික ගිණුම්වලට ඇතුළත් නොකෙරෙන රාජ්‍ය වියදම් ශීර්ෂය කුමක් ද?
1. සේවක වැටුප් ගෙවීම
2. පොලී ගෙවීම
3. යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම
4. පාසල් ගොඩනැගිලි ඉදි කිරීම
5. ශුද්ධ ණය දීම (..................)

35. මෑත වර්ෂවලදී ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට භාවිතා කළ මූලාශ්‍රය වී ඇත්තේ,
1. මහ බැංකු අත්තිකාරම්ය
2. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරය
3. භාණ්ඩාගාර බිල්පත්ය.
4. භාණ්ඩාගාර බැඳුම්කරය
5. රුපියල් සුරැකුම්පත්ය. (..................)

36. 2017 වසරේ මුළු රාජ්‍ය ණය හා සමස්ත අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස නිවැරදිව දැක්වෙන සංයෝජනය කුමක් ද?

| | මුළු රාජ්‍ය ණය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස) | සමස්ත අය වැය හිඟය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|
| 1. | 70.8 | 0.0 |
| 2. | 71.3 | -0.7 |
| 3. | 77.6 | -5.5 |
| 4. | 77.7 | -5.7 |
| 5. | 78.8 | -7.6 |

(..................)

37. යම් ආර්ථික ක්‍රියාවලියක බාහිරතා එහි පෞද්ගලික පිරිවැයට හා පෞද්ගලික ප්‍රතිලාභවලට ගැලපූ පසු, සමාජය සම්බන්ධයෙන් ප්‍රශස්ත නිමැවුම එහි වෙළඳපොළ නිමැවුම් මට්ටමට සමපාත වන්නේ,
1. නිෂ්පාදනයේ බාහිර පිරිවැය, පරිභෝජනයේ බාහිර පිරිවැයට සමාන වන විටය.
2. නිෂ්පාදනයේ බාහිර ප්‍රතිලාභ, පාරිභෝජනයේ බාහිර ප්‍රතිලාභවලට සමාන වන විටය.
3. නිෂ්පාදනයේ බාහිර පිරිවැය, පරිභෝජනයේ බාහිර ප්‍රතිලාභ ඉක්මවා යන විට ය.
4. නිෂ්පාදනයේ බාහිර ප්‍රතිලාභ, පරිභෝජනයේ බාහිර පිරිවැයට සමාන වන විට ය.
5. නිෂ්පාදනයේ බාහිර ප්‍රතිලාභ, පරිභෝජනයේ බාහිර පිරිවැය ඉක්මවා යන විටය. (..................)

38. විවෘත ආර්ථිකයක දේශීයව නිපදවන ලද සහ ආනයනය කරන ලද කමිසයක මිල රුපියල් 2000 කි. දේශීයව කමිස නිෂ්පාදනයේදී ආනයන යෙදවුම් 60% භාවිත කරයි. දේශීය කමිස කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා ආනයන කමිස මත 20% ක තීරුබද්දක් රජය පනවන අතර ආනයන යෙදවුම් සඳහා ද 10% ක තීරු බද්දක් රජය පනවනු ඇත. තීරුබද්දේ සාඵල්‍ය ආරක්ෂණ අනුපාතය,

සාඵල්‍ය ආරක්ෂණ අනුපාතය

| | යෙදවුම් සඳහා තීරු බදු පැනවීමට පෙර | යෙදවුම් සඳහා තීරු බදු පැනවීම යටතේ |
|---|---|---|
| 1. | 30% | 75% |
| 2. | 35% | 60% |
| 3. | 40% | 45% |
| 4. | 50% | 35% |
| 5. | 80% | 20% |

(..................)

39. රටක කිසියම් වර්ෂයක අපනයන මිල දර්ශකය 150% කින් ඉහළ ගොස් ඇති අතර ආනයන මිල දර්ශකය 125% කින් ඉහළ යන ලදී. මෙම ආර්ථිකය විදේශ වෙළඳ අනුපාතයයි.

1. 150 කි
2. 120 කි
3. 111.1 කි
4. 90 කි.
5. 83.33 කි (..................)

40. එක්තරා ආර්ථිකයකට අදාළ විදේශ වත්කම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **අයිතමය** | **2017** | **2018** |
|---|---|---|
| රජයේ විදේශ වත්කම් | 500 | 600 |
| මහබැංකුවේ විදේශ වත්කම් | 1000 | 1200 |
| තැන්පතු බාරගන්නා ආයතනවල විදේශ වත්කම් | 2000 | 2500 |
| සංචිතවලට අදාළ වගකීම් | 400 | 600 |

ඉහත දත්තවලට අනුව මෙම ආර්ථිකයේ 2018 වර්ෂයේ ගෙවුම් ශේෂ ගිණුමේ සමස්ත ශේෂය කොපමණ ද?

1. - 100
2. -200
3. 1200
4. 2100
5. 3700 (..................)

41. විනිමය අනුපාතිකයේ ක්ෂය වීමක් / අවප්‍රමාණය කිරීමක් වෙළෙඳ ශේෂය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කිරීමට පහත සඳහන් කුමන කොන්දේසියක් වඩාත් සාර්ථක වන්නෙහි ද?

| | අපනයන මිල ඉල්ලුම් නම්‍යතාවය | ආනයන මිල ඉල්ලුම් නම්‍යතාව | අපනයන සැපයුම නම්‍යතාව |
|---|---|---|---|
| 1. | -0.2 | -0.4 | 0.5 |
| 2. | -0.25 | -0.5 | 0.7 |
| 3. | -2.5 | -1.6 | 0.4 |
| 4. | -2.5 | -1.6 | 1.7 |
| 5. | -0.4 | -1.2 | 1.0 |

(..................)

42. රුපියලේ අගය තීරණය වන විදේශ විනිමය වෙළෙඳ පොළෙහි හුවමාරු වන්නේ ඩොලර් සහ රුපියල ය. මෙහි ඉල්ලුම් වක්‍රයෙන් පෙන්නුම් කරනුයේ රුපියලට කරන ඉල්ලුම වේ. එය තීරණය වන්නේ පහත සඳහන් කවර කරුණක් මත ද?

1. ශ්‍රී ලංකාවේ අපනයන මිලදී ගන්නන් තුළින් ය.
2. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධනය පිටතට ගලා යාම තුළින්ය.
3. ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම තුළින්ය.
4. ශ්‍රී ලාංකිකයින් ඇමරිකාවේ සංචාරය කිරීම තුළින් ය.
5. විදේශ රටවල අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික සිසුන් තුළින්ය.

(..................)

43. කිසියම් රටක නාමික විනිමය අනුපාතිකය ක්‍රයශක්ති සාම්‍ය විනිමය අනුපාතිකයට සාපේක්ෂව අධිතක්සේරු වී පවතී නම්

1. වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් ඇති වේ.
2. වෙළෙඳ ශේෂයට කිසිදු බලපෑමක් ඇති නොවේ.
3. වෙළෙඳ ශේෂයේ හිඟයක් ඇති වේ.
4. වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් සහ ජංගම ගිණුමේ අතිරික්තයක් ඇති වේ.
5. වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් හෝ හිඟයක් ඇති වේ. (..................)

44. ගෙවුම් ශේෂය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. වෙළෙඳ ශේෂය සහ මූල්‍ය ගිණුම් එකතු ප්‍රාග්ධන ගිණුම් ශේෂයට සමාන විය යුතුය.
2. ප්‍රාග්ධන ගිණුමේ සහ ජංගම ගිණුමේ එකතු වෙළෙඳ ශේෂයට සමාන විය යුතුය.
3. ශුද්ධ අපනයන සහ ප්‍රාග්ධන ගිණුමේ එකතු මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන විය යුතුය.
4. වර්තන ගිණුමේ සහ මූල්‍ය ගිණුමේ එකතුය ප්‍රාග්ධන ගිණුමේ ශුද්ධ ශේෂයට සමාන විය යුතුය.
5. ජංගම ගිණුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ එකතු මූල්‍ය ගිණුමේ ශුද්ධ ශේෂයට සමාන විය යුතුය. (..................)

45. ආදායම් විෂමතාව මැනීම සඳහා යොදා ගත හැකි මිණුම වන්නේ,
1. ලෝරන්ස් වක්‍රය
2. ඒකපුද්ගල ආදායම
3. ආර්ථික වර්ධන අනුපාත
4. ශ්‍රම ශක්ති සාමාජ දළ ජාතික ආදායම
5. බහුමාන දරිද්‍රතා දර්ශකය (..................)

46. කිසියම් රටක ප්‍රජාවිද්‍යාත්මක දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු දත්ත මිලියනවලිනි)

| | |
|---|---|
| ජනගහනය | 60 |
| වැඩකළ හැකි වයසේ ජනගහනය | 50 |
| සේවා නියුක්ති සංඛ්‍යාව | 28 |
| සේවා වියුක්ති සංඛ්‍යාව | 2 |

ඉහත දත්ත අනුව ආර්ථිකයේ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය
1. 40% 2. 56%
3. 60% 4. 75%
5. 43% (..................)

47. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය හඳුනා ගන්න.

| | කෘෂි අංශය % | කර්මාන්ත අංශය% | සේවා අංශය % |
|---|---|---|---|
| 1. | 6 | 26 | 56 |
| 2. | 7 | 27 | 56 |
| 3. | 8 | 25 | 54 |
| 4. | 7 | 27 | 57 |
| 5. | 6 | 26 | 57 |

48. තිරසාර සංවර්ධනයේ පැතිකඩ තුන නිවැරදි දැක්වෙන වරණය තෝරන්න.
1. ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය
2. ආර්ථික සංවර්ධනය, පරිසර සංරක්ෂණය, ආර්ථික නිදහස
3. ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, පරිසර සංරක්ෂණය
4. ආර්ථික සංවර්ධනය, දේශපාලන නිදහස, සංස්කෘතික සංවර්ධනය
5. ආර්ථික වෘද්ධිය සමාජ සාධාරණත්වය, පාරිසරික සංවර්ධනය (..................)

49. මෑත කාලීන ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතයේ හා සේවා නියුක්තියේ ව්‍යුහමය වෙනසක් ලෙස දැකිය නොහැකි තත්ත්වයක් වනුයේ,
1. කාෂිකාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශත වැදගත්කම අඩුවීම
2. කාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක වැදගත්කම වැඩිවීම
3. සේවා නිෂ්පාදිතයේ ප්‍රතිශතය වැදගත්කම වැඩිවීම
4. කෘෂි අංශයේ සේවා නියුක්තිය ප්‍රතිශතය අඩුවීම
5. කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය අඩුවීම (..................)

50. 2017 වර්ෂයේ මුළු විදේශ විනිමය ඉපයීම්වල දායකත්වයෙන් තුන්වන ස්ථානයට පත්ව ඇත්තේ,
1. විදේශ ප්‍රේෂණ
2. රෙදිපිළි හා ඇඟළුම්
3. සංචාරක කර්මාන්තය
4. ඛනිජ තෙල් නිෂ්පාදනය
5. සම්භාණ්ඩ ප්‍රවාහනය හා පාවහන් උපකරණ (..................)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Educa-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණ, 2019
General Certificate of Education (Adv. Level), Grade 13, Year End Test, July 2019

# ආර්ථික විද්‍යාව II
# Economics - II

21 S II

පැය 03 යි
Three hours
අමතර කියවීම විනාඩි 10යි

විභාග අංකය:....................................................................

උපදෙස්: * 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

## 'අ' කොටස

1. (i) ''ස්වභාවික සම්පත්'' සංකල්පය අර්ථකථනය කර එහි වර්ගීකරණය උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 4)

(ii) ප්‍රාග්ධනයේ විවිධ ස්වරූප කවරේ ද? ඒවා අතුරෙන් සමාජ ශුභ සාධනය ඉටුකිරීමට කවරක් දායක වේ ද? (ලකුණු 4)

(iii) ආර්ථික පද්ධතින්හී විවිධත්වයට බලපාන සාධක කවරේ ද? (ලකුණු 4)

(iv) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ආන්තික ආවස්ථික පිරිවැය හැසිරෙන ආකාරය අනුව එහි ස්වරූප කවරේද? ඉන් වඩාත් තාත්වික ස්වරූපය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(v) නිෂ්පාදන කාර්යක්ෂමතාව තුළින් පමණක් ආර්ථික කාර්යක්ෂමතාව අත්කර ගත නොහැක. විමසන්න. (ලකුණු 4)

2. (අ) (i) පෞද්ගලික (ආයතනයක) සැපයුම් වක්‍රය හා වෙළඳ සැපයුම් වක්‍රය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) සලකා බලන භාණ්ඩය බාල භාණ්ඩයක් නම් මිල වැඩිවීමක ආදායම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය පැහැදිලි කරන්න. (ලකුණු 3)

(iii) පහත සඳහන් භාණ්ඩ හඳුනා ගන්න.
(අ) x හා y භාණ්ඩ අතර හරස් ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගැනීම
(ආ) y භාණ්ඩයේ ආදායම ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගැනීම.
(ඉ) z භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව 0.6ක අගයක් ගැනීම (ලකුණු 3)

(iv) තරගකාරී වෙළඳපොළක අළෙවි වන එක්තරා භාණ්ඩයක් සඳහා මිල ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණයන් පහතින් දැක්වෙයි. (මිල රුපියල්වලින්)

| මිල රු | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 4 | 10 | 2 |
| 6 | 8 | 4 |

(ආ) (i) සමතුලිත මිල හා ප්‍රමාණය වීජ ගණිතමය ලෙස ගණනය කොට සමතුලිත මිලේ දී නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 4)

(ii) තරගකාරී වෙළඳපෙලක භාණ්ඩයක මිල රු 5 දී අධි ඉල්ලුම 450 ක් වන අතර මිල රු 15 දී අධි සැපයුම 300 කි. සමතුලිත මිල ප්‍රස්තාර රූප සටහනක දක්වන්න. (ලකුණු 4)

(iii) පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණයන් ය.
$Qd=90-0.2p \quad Qs=-85+0.5p$
සෑම මිලකදීම ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණ ඒකක 10 බැගින් අඩු වී නම් සමතුලිත මිල සහ එම මිලේදී පාරිභෝගික අතිරික්තය ගණන් බලන්න. (ලකුණු 4)

3. (අ) කිසියම් භාණ්ඩ වෙළඳපොළක ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සරල රේඛීය වේ. එම භාණ්ඩයේ පහත තොරතුරු ඔබට දක්වා ඇත.

| මිළ රු | අධි ඉල්ලුම ප්‍රමාණය | ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|
| 10 | 400 | 400 |
| 35 | -100 | 150 |

(i) ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්තාරගත කොට සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණයන් දක්වන්න. (ලකුණු 3)

(ii) ඉහත භාණ්ඩයෙහි වෙළඳපොළ අලෙවි කරණ සෑම ඒකකයකට ම රු 10 ක් සහනාධාරයක් දෙන්නේ නම් සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 4)

(iii) සහනාධාරයට පසු නිෂ්පාදන අතිරික්තය කොපමණ ද? (ලකුණු 2)

(iv) සහනාධාරයේ ශුභ සාධන ප්‍රතිවිපාකය කොපමණ ද? (ලකුණු 2)

(ආ) කිසියම් භාණ්ඩයක් සම්බන්ධ වෙළඳපොල ඉල්ලුම් සැපයුම් තත්වයන්ට අදාළ මිල සමීකරණයන් (ප්‍රතිලෝම) පහත දක්වේ.

$P_D = 170-2Q$ $Ps = 20+3Q$ (මිල රුපියල් වලින්)

(i) සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ii) සමතුලිත මිලට අදාළ පාරිභෝගික පැහැදම කොපමණ ද? (ලකුණු 2)

(ඉ) x භාණ්ඩය සම්බන්ධ වෙළඳ පොළ ඉල්ලුම සැපයුම් තත්වයන්ට අදාළ සමීකරණයක් පහත දක්වේ.

$Qd = 100-3P$ $Qs = 40+2P$

(i) ඉහත භාණ්ඩයෙහි ආනයන මිල මත 25% තීරුබද්දක් සහිතව රුපියල් 10 මිලට ආනයනය කරයි නම් වෙළඳපල සමතුලිත ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 2)

(ii) තීරුබද්ද ඉවත් කිරීමට රජය පියවර ගත හොත් රජයට අහිමිවන තිරුබදු ආදායම කොපමණද? (ලකුණු 3)

4. (i) පහත දැක්වෙන ප්‍රකාශවලට එකඟ විය හැකි ද? නොහැකි ද? යන්න දක්වා ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(අ) කෙටි කාලයකදී නිමැවුම ප්‍රසාරණය කරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය සහ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය අතර පරතරය ක්‍රමයෙන් වැඩි වේ.

(ආ) පරිමාණානුකූල පිරිමැසුම් හටගන්නා විට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළට ගමන් කරයි.

(ඇ) කෙටි කාලයේදී මුළු ඵලදාව උපරිම වන විට ආන්තික ඵලදාව පහත වැටේ.

(ඉ) කෙටි කාලයේදී විචල්‍ය යෙදවුම් වැඩි වේගයෙන් ඉහළ යන විට ආන්තික පිරිවැය වක්‍රය වැඩි වේගයෙන් ඉහළ නගී. (ලකුණු 2 x 4)

(ii) පහත දැක්වෙන්නේ පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයකට අදාළ ඉල්ලුම් වක්‍ර හා පිරිවැය වක්‍රයන් ය.




(අ) වෙළඳපොල මිල රු 80ක් වේ නම් නිෂ්පාදකයා ආයතනය වසා දැමීමට කටයුතු කරන්නේ ද? පැහැදිලි කරන්න.

(ආ) මිල රු 100 වන විට නිෂ්පාදකයා ලබන ලාභය කොපමණ ද? (ලකුණු 2)

(ඇ) මිල රු 100 දී ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණ ද? (ලකුණු 1)

(iii) පූර්ණ තරගකාරී වෙළඳ පොළක් ඒකාකාරී තරග වෙළඳපොලත් අතර දැකිය හැකි වෙනස්කම් මොනවා ද? (ලකුණු 4)

(iv) නිෂ්පාදන සාධකයක සැපයුම් අනම්‍යතාව වැඩිවන විට සංග්‍රාම ඉපයුම් හා ආර්ථික බදු කුලිය කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 3)

5. (i) ජාතික ගිණුම්වල ඇතුළත් ප්‍රාථමික ආදායම් (Primer income) සංකල්පය පැහැදිලි කර එහි ප්‍රධාන සංරචක හඳුන්වන්න. (ලකුණු 4)

(ii) කිසියම් ආර්ථිකයක එක්තරා වර්ෂයකට අදාළ කල්පිත සාර්ව ආර්ථික දත්ත පහත දැක්වේ. වටිනාකම (රුපියල් බිලියනවලිනි)

| | | |
|---|---|---|
| කුටුම්බ අවසාන පාරිභෝජන වියදම | = | 6000 |
| භාණ්ඩ සහ සේවා අපනයන වටිනාකම | = | 1200 |
| දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | = | 3500 |
| ආණ්ඩුවේ අවසන් පරිභෝජන වියදම | = | 4000 |
| තොග හෙවත් පරිලේඛණ වෙනස්වීම් | = | 1000 |
| භාණ්ඩ හා සේවා ආනයන | = | 2400 |
| ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්බවෙත සේවා සපයන ආයතනික ඒකකයන්ගේ අවසන් පරිභෝජන වියදම | = | 500 |
| වටිනා දෑ අත්පත් කරගැනීම් සහ අත්හැරීම් | = | 200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම් | = | 100 |
| නිෂ්පාදිතය මත පනවන බදු - සහනාධාර | = | 600 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් | = | -700 |
| රජයේ සමූහ පරිභෝජන වියදම | = | 2400 |
| විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම | = | 1700 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වෙළඳ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 3)
(ආ) දළ ජාතික ආදායම (ලකුණු 1)
(ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 1)
(ඊ) සත්‍ය සුනිශ්චිත පෞද්ගලික පරිභෝජන වියදම (ලකුණු 1)
(උ) මූලික මිල යටතේ සමස්ත එකතු කළ අගය (ලකුණු 1)
(ඌ) දළ ජාතික ඉතුරුම් (ලකුණු 1)

(iii) ආර්ථිකයක සිදුවන ඉතුරුම් සහ ආයෝජනයේ හට ගන්නා වෙනස්කම් සමස්ත නිමවුම් මට්ටම කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) කිසියම් කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන)

| | | |
|---|---|---|
| ආන්තික පරිභෝජන නැම්යාව | = | 0.8yd |
| ආයෝජන වියදම | = | 250 |
| ස්වාධීන පරිභෝජන වියදම | = | 100 |
| රාජ්‍ය මිල දී ගැනීම් | = | 400 |
| රාජ්‍ය බදු ආදායම | = | 300 |
| සංක්‍රාම වියදම් | = | 100 |
| ආනයන | = | 400 |
| අපනයන | = | 150 |

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 3)
(ආ) රාජ්‍ය බදු ආදායම රුපියල් මිලියන 200 කින් කපා හැරියහොත් නව සමතුලිත ජාතික ආදායම කොපමණ වේ ද? (ලකුණු 1)

## ''ආ'' කොටස

6. (i) මුදල් යනු මොනවා ද? හොඳ මුදලක තිබිය යුතු ගුණාංග මොනවා ද? (ලකුණු 4)

(ii) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනය යනු කුමක් ද? ඒ ඇසුරින් උද්ධමනය මිණුම් කරන්නේ කෙසේ ද? (ලකුණු 4)

(iii) ''වාණිජ බැංකුවක් ගැටෙනසුලු අරමුණු දෙකකට මුහුණ දේ'' එම අරමුණු දෙක නම් කොට ඒවා එකිනෙක ගැටෙන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) එක්තරා වාණිජ බැංකුවක පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක් මතු දැක්වේ.

| වගකීම් (රු මිලියන) | | වත්කම් (රු මිලියන) | |
|---|---|---|---|
| තැන්පතු | 10000 | සංචිත | 6000 |
| | | ණය | 4000 |
| මුළු වගකීම් | 10000 | මුළු වත්කම් | 10000 |

මෙම වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් නම් මෙම බැංකුවට ලබාදිය හැකි අලුත් ණය ප්‍රමාණය කොපමණ ද? බැංකු පද්ධතියට මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 4)

(v) පහත සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.
(අ) පදනම් මුදල් හා මුදල් ගුණකය
(ආ) මුදල් වෙළඳපොල හා ප්‍රාග්ධන වෙළඳපොල (ලකුණු 4)

7. (i) වෙළඳ පොළ ක්‍රමයක දක්නට ලැබෙන ''අපූර්ණ තොරතුරු'' යන සංකල්පයෙන් කුමක් අදහස් වේ ද? එය වෙළඳ පොළ අසමත්වීමට තුඩු දෙන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) ''පොදු භාණ්ඩ'' හා ''පොදු සම්පත්'' යනු සමාන අරුත දෙන සංකල්ප දෙකකි. මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යන්නෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 2)

(iv) රාජ්‍ය අයවැය ලේඛනයට අදාළ කල්පිත දත්ත සමහරක් මතු දැක්වේ.

| | රුපියල් මිලියනවලිනි |
|---|---|
| පුනරාවර්තන වියදම | 175000 |
| බදු ආදායම | 150000 |
| විදේශීය ප්‍රදාන | 5000 |
| ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණයදීම | 25000 |
| රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම් | 21000 |
| ණය වාරික ආපසු ගෙවීම් | 6000 |
| බදු නොවන ආදායම | 15000 |

අදාළ දත්ත පමණක් තෝරාගෙන පහත දේ ගණනය කරන්න.

(අ) වර්තන ගිණුමේ ශේෂය (ලකුණු 2)

(ආ) සමස්ත ගිණුමේ ශේෂය (ලකුණු 2)

(ඉ) ප්‍රාථමික ගිණුමේ ශේෂය (ලකුණු 2)

(v) 2000 වසරේ රුපියල් මිලියන 1,218,700 ක් වූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය 2017 වසරේදී රුපියල් මිලියන 10, 313, 045 ක් පමණ විය. මෙලෙස රාජ්‍ය ණය ඉහළයාමක ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 4)

8. (i) ජපානය කොරියාව යන රටවල් දෙක පරිගණක යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය සිදු කරයි. එක් එක් රටෙහි පරිගණක යන්ත්‍රයක් සහ රූපවාහිනී යන්ත්‍රයක් නිපදවීමට වැයවන ශ්‍රම ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

| රට | රූපවාහිනී යන්ත්‍රයක් නිපදවීමට වැයවන ශ්‍රම ප්‍රමාණය (ශ්‍රම පැය) | පරිගණක යන්ත්‍රයක් නිපදවීමට වැයවන ශ්‍රම ප්‍රමාණය (ශ්‍රම පැය) |
|---|---|---|
| කොරියාව | 8 | 16 |
| එක්සත් ජනපදය | 12 | 48 |

(අ) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේලා නිරපේක්ෂ වාසි පවතින රට තෝරන්න (ලකුණු 1)

(ආ) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ලා සාපේක්ෂ වාසි පවතින රට නම් කරන්න. (ලකුණු 2)

(ඉ) රටවල් දෙක අතර බාහිර වෙළඳාමක් ගොඩනගන්නේ නම් බාහිර හුවමාරු අනුපාතය ගණනය කරන්න. (ලකුණු 1)

(ii) නිදහස් වෙළඳාමට සීමාවක් ඇති කෙරෙන රටවල් විසින් අනුගමනය කරනු ලබන තීරුබදු නොවන වෙළඳ බාධක කවරේ ද? (ලකුණු 4)

(iii) බහු පාර්ශ්වීය වෙළඳ සංවිධානයක් (Multi tastera trade organisations) යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iv) 2018 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකාව දැනට ක්‍රියාත්මකව පවතින ද්විපාශ්වික සහ බහු පාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 4)

(v) ද්විත්ව සටහන් මූලධර්මය යොදා ගනිමින් පහත සඳහන් ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයක වාර්තා කරනුයේ කෙසේද?

(අ) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදි කිරීම සඳහා ජපන් රජයෙන් ලබා ගත් ණය මුදලක් වෙනුවෙන් ඩොලර් බිලියන 12000 ක් වූ ණය පොලී ප්‍රමාණයක් ගෙවීම.

(ආ) ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අදාළ වර්ෂයේ ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් රුපියල් මිලියන 20,000 ක ණය මුදලක් ලබා ගැනීම. (ලකුණු 1 x 2)

(iv) ගෙවුම් ශේෂ ලේඛණයේ සමස්ත ගිණුම් හිඟයක් දිගු කාලීනව පවතින්නේ නම් ඒ සඳහා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 4)

9. (i) ආර්ථික වර්ධනය හා සංවර්ධනය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීමට කටයුතු කිරීමේදී ශ්‍රී ලංකාව මුහුණ පාන ප්‍රධාන අභියෝග මොනවා ද? (ලකුණු 4)

(iii) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රමාණය හා ස්වභාවය පිළිබඳව මෑත කාලීන ප්‍රවණතා මොනවා ද? (ලකුණු 4)

(iv) 'ජාතික දරිද්‍රතා ඉම' හා 'පංචම අපකිරණ අනුපාතය' යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 4)

(v) මානව සංවර්ධන දර්ශකය යොදා ගනිමින් දකුණු ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන මට්ටම පැහැදිලි කරන්න. (ලකුණු 4)

10. (i) 1977 න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ අපනයන අභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ඉලක්ක කවරේ ද? (ලකුණු 4)

(ii) විදේශ සේවා නියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා කවරේ ද? (ලකුණු 4)

(iii) ආර්ථික හා සමාජීය වශයෙන් යටිතල පහසුකම් වැදගත් වීමට බලපාන හේතු කවරේ ද? (ලකුණු 4)

(iv) ආර්ථිකයේ විවිධ අංශ කෙරෙහි ඍජුවම හෝ වක්‍ර ලෙස බලපෑම් කරන දේශීය හා ගෝලීය සිදුවීම් නිදසුන් මගින් දක්වන්න.

(v) 2000 වසරේ හඳුන්වා දුන් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයන්ට අනුප්‍රාප්තික අභිමතාර්ථ ලෙස හිතකර සංවර්ධන අභිමතාර්ථ 17 ක් 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එළි දක්වා ඇත. තිරසාර සංවර්ධන අභිමතාර්ථ කෙරෙහි අවධානය යොමු වී ඇති පුළුල් ක්ෂේත්‍ර 05 කවරේ ද? (ලකුණු 4)